කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2016

2022 - මැයි

**BCOME 1055 – ව්‍යාපාර හා කාර්මික නීතිය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 08 කාලය : පැය 03 යි

ඔබ විසින් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරා ගෙන මුළු ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

**1 කොටස**

**ප්‍රශ්ණ අංක 01**

අ. වලංගු ගිවිසුමක් සෑදීම සඳහා අවශ්‍ය මූලිකාංග 05 ක් සුදුසු නිදසුන් ඇසුරින් දක්වන්න.

(ලකුණු 10)

ආ. වැදගත් ලිපිලේඛන කිහිපයක් අඩංගු වූ සමන්තිගේ අත් බෑගය නැති විය. මෙම අත්බෑගය සමන්තට හමු වූ අතර එය සමන්තිට භාර දීමට ඔහුට අවශ්‍ය විය. මේ අතර සිය අත්බෑගය සොයා දෙන කෙනෙකුට රු. 15000/- ත්‍යාගයක් පිරිනමන බවට පුවත්පත් දැන්වීමක් පළ කරන ලදී. මෙම දැන්වීම පිළිබඳව කිසිවක් නොදත් සමන්ත අදාල අත් බෑගය සමන්ති වෙත භාර දුනි. නමුත් අදාල ත්‍යාගය පිළිබඳව පසුව දැන ගත් සමන්ත, ත්‍යාග මුදල සමන්ති වෙතින් ඉල්ලා සිටියේය. එවිට සමන්ති, එම මුදල ලබා දීම ප්‍රතික්ෂේප කරන ලදී. දැන් සමන්ත සමන්තිට එරෙහිව නීතිමය පියවර ගැනීමට අදහස් කරයි. ඔහුට උපදෙස් දෙන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 02**

අ. නියෝජිතයෙකු සතු යුතුකම් 05 ක් දක්වා ඒවා අදාල නඩු තීන්දු සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. ශ්‍රී ලංකාවේ පිහිටි ෆ්‍රේෂ් ෆෘට් සමාගම විදේශ රටවල සිට පළතුරු ආනයනය කරන සමාගමකි. ඔවුන් රු. මිලියන 50 ක් වටිනා ඇපල් තොගයක් ඕස්ට්‍රේලියාවේ සිට මෙරටට බොන් වොයේජ් නෞකාව මගින් ආනයන කරන ලදී. වරාය සේවකයන් අඛණ්ඩව පැවැත්වූ වර්ජනය හේතුවෙන් නැවට කොළඹ වරායට ඇතුළු වීමට නොහැකි විය. අදාල නැව සති 02 කට වැඩි කාලයක් ගැඹුරු මුහුදේ නැංගුරම් ලා තිබූ අතර අදාල පළතුරු නශ්‍ය වීමට යන බැව් නැවේ කපිතාන් දුටුවේය. වහාම කොළඹ පිහිටි අදාල සමාගම සමඟ මේ සම්බන්ධයෙන් සන්නිවේදනය කිරීමට උත්සාහ කළත් එම උත්සාහය වියකී ගියේය. අදාල හානිය අවම කිරීම උදෙසා අදාල නැව සිංගප්පූරු වරාය වෙත රැගෙන ගිය කපිතාන් එම ඇපල් තොගය රු. මිලයන 40 කට එහිදී අලෙවි කොට එම මුදල අදාල සමාගම වෙත යැවීය. දැන් තමාට වූ හානිය පිළිබඳව අදාල නැව් කපිතාන්ට එරෙහිව නඩු පැවරීමට ෆ්‍රේෂ් ෆෘට් සමාගම අදහස් කරයි. ඔවුනට උපදෙස් දෙන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 03**

අ. අමර, බිනර සහ සුනිර, කෙල වල්ලා මසුන් මිලදී ගැනීම සඳහා වෙනමම ගිවිසුම් තුනක් ඕෂන් ෂිප් සමාගම සමඟ එළඹේ. එම ගිවිසුම් වලට අනුව අමර, බිනර සහ සුනිර පිළිවෙලින් මාළු පෙට්ටි 20,85 සහ 85 වශයෙන් මිලදී ගනියි. අදාල සමාගම මාළු පෙට්ටි 190, දුම්රිය සමාගමට භාර දී අදාල දුම්රිය ස්ථාන වලදී එකිනෙකාට හිමි මාළු පෙට්ටි භාර දෙන ලෙස උපදෙස් ලබා දුනි. නමුත් දුම්රිය ප්‍රමාද වීම හේතු කොට ගෙන අදාල තිදෙනාට මාළු තොග භාර දීමට පෙර ඒවා නශ්‍ය විය. මෙම මාළු තොග සම්බන්ධයෙන් කවුරුත් විසින් පාඩුව විඳ දරා ගත යුතු ද ? විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. භාණ්ඩ විකිණීමේ ගිවිසුමකට අදාල ව්‍යාංග කොන්දේසි සහ වොරන්ටි අතර වෙනස්කම් පෙන්වා දෙන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 04**

අ. දකුණු පළාතේ පිහිටි විදේශිකයන් ආකර්ශනය කරනු ලබන ස්ථාන නැරඹීම සඳහා විදේශිකයන්ට සෑම දිනකම වාහන අටකින් ගෙන යැම සඳහා ජෝන්, විසිට් ශ්‍රී ලංකා ආයතනය සඳහා ගිවිසුමකට එළඹුනි. නමුත් පවත්නා මිල වැඩිවීම හේතු කොට විදේශිකයන් එමස 'ථාන වලට ගෙන යාම සඳහා දැනට එකඟ වූ මුදල් ප්‍රමානවත් නොවන බැව් ජෝන්ට පෙනී ගියේය. අදාල ආයතන වෙත ගිය ජෝන් ප්‍රකාශ කර සිටියේ එක්තරා දිනයක සිට තමන් අදාල වාහන සැපයීම නවතාලන බවයි. එවිට සමාගම ප්‍රකාශ කළේ ජෝන්ට තවදුරටත් අදාල සේවය සැපයීමට හැකි නම් වාහනයක් සඳහා දෛනිකව රු. 2000/- අමතර ගාස්තුවක් ගෙවිය හැකි බවයි. මේ සඳහා ජෝන් එකඟ විය. නමුත් අදාල සේවය සම්පූර්ණ කිරිමෙන් අනතුරුව අදාල

කුවිතාන්සිය සමාගම වෙත ගෙවීම සඳහා ඉදිරිපත් කළ විට එම අමතර මුදල ගෙවීම සමාගම විසින් ප්‍රතික්ෂේප කෙරුණි.

විසිට් ශ්‍රී ලංකා ආයතනය මෙම අමතර මුදල ගෙවීමේ වගකීමෙන් බැඳේද?

කොවිඩ් 19 රෝගය පැතිරීම හේතුවෙන් දිවයින පුරා බලපැවැත්වෙන පරිදි ඇඳිරි නීතිය පැනවුවේ නම් ජෝන් සහ අදාල සමාගම අතර පැවති ගිවිසුමට කුමක් සිදු වේද ?

(ලකුණු 10)

ආ. ගිවිසුම් කඩ වීමේදී වන්දි ගෙවීමට අදාල රීති සැකෙවින් දක්වන්න. විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

## 11 කොටස

**ප්‍රශ්ණ අංක 05**

අ. ඩෙලිෂ් ආපන ශාලාවේ හිමිකරු වූ ලාල්, එම ආපන ශාලාව පිරිසිදු කිරීම සඳහා පිලිප්ව සේවයේ යෙදවීය. සෑම මුරයක් අවසානයේම පිලිප් විසින් මුළුතැන්ගෙය, ආපනශාලාව සහ භාණ්ඩ පිරිසිදු කළ යුතුය. පිලිප් ලාල්ගේ අවශ්‍යතාවය හොඳහැටි දන්නා අතර, තමා කොපමණ කාලයක් වැඩ කරනවාද යන්න පිලිප් තිරණය කළ අතර, ඔහුව සහ ලාල් අතර පැවති ගිවිසුමට අනුව අදාල කාර්ය උදෙසා එකඟ මිලක් ගෙවූ අතර ගෙවීම් හුදෙක් වැඩ කරනු ලබන පැය ගණන අනුව තීරණය නොවීය. අදාල ආපනශාලාව උදේ 9.00 ට විවෘත කිරීමට පෙර ඕනෑම වේලාවක එහි පැමිණ පිරිසිදු කිරිමේ කටයුතු වල නියැලිමට පිලිප්ට හැකි විය. පිලිප් පිරිසිදු කිරීමේ කටයුතු සඳහා තමාගේම පිරිසිදු කිරීමේ උපකරණ සහ තම සේවකයන්ම යොදා ගත්තේය. සෑම මසකට අවසානයේ තමා වැඩ කළ දින ගණනත්, පාවිච්චි කළ පිරිසිදු කිරීමේ උපකරණ වටිනාකමත් සඳහන් රිසිට්පතක් පිලිප් විසින් ලාල් වෙත ලබා දෙන ලදී. පිලිප් වැඩ කරන විට, ලාල් එය සුපරීක්ෂණය කළේ නැත. නමුත් ඔහු අදාල ප්‍රමිතින්ට වඩා අඩුවෙන් සිය දායකත්වය ලබා දීම නිසා යම් පාඩුවක් සිදු වුවහොත් ඒ සඳහා පිලිප් වගකිව යුතු විය.

ඔබ විසින් කාර්මික නිතිය යටතේ හඳුනා ගෙන ඇති විවිධ පරීක්ෂාවන් භාවිත කරමින් පිලිප් සේවකයෙකුද එසේත් නැත්නම් ස්වාධින ගිවිසුම්කරුවෙක්දැයි දක්වන්න.

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 06**

අ. කාර්මික ආරවුල් නිරවුල් කිරීමේ පනතේ දැක්වෙන කාර්මික ආරවුල් නිරවුල් කරන විවිධ වූ ක්‍රම මොනවාද ?

(ලකුණු 08)

ආ. කාර්මික ආරවුල් යනු කුමක්ද ?

(ලකුණු 06)

ඇ. අනිවාර්ය බේරුම්කරණය සහ ස්වේච්ඡා බේරුම්කරණ අතර ඇති වෙනස්කම් පෙන්වා දෙන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 07**

පහත සඳහන් දෑ වෙත අවධානය යොමු කරමින් 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත පිළිබඳ සටහනක් ලියන්න.

අ. වැඩ කරන පැය ගණන

ආ. අතිකාල දීමනා

ඇ. පොදු නිවාඩු

ඉ. වාර්ෂික නිවාඩු

ඊ. මාතෘ ප්‍රතිලාභ

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 08**

අ. වෘතිය සමිතියක අරමුණු මොනවාද ?

(ලකුණු 04)

ආ. විවිධ වූ වැඩවර්ජන මොනවාදැයි නම් කොට පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල අතර සමාන අසමානකම් පෙන්වා දෙන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)